ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
**President of Sri Lanka**

## අලුත් අවුරුදු පණිවුඩය

දේශයේ අසිරිමත් මහා සංස්කෘතික මංගල්‍යය වන සිංහල සහ දෙමළ අලුත් අවුරුද්ද රටවැසි සියලු ජනතාවට සාමය, සතුට, සෞභාග්‍යය සපිරි මෙන්ම නිරෝගීමත් කාලපරිච්ඡේදයක් වේවා යි මම ප්‍රාර්ථනා කරමි.

වාර්ෂික සූර්ය සංක්‍රාන්තියත් සමග එළඹෙන අලුත් අවුරුද්ද සංකේතීයෙන්, සාමූහිකත්වයෙන්, අන්‍යොන්‍ය සබඳතා වර්ධනයේත් සමය ලෙස හැඳින්වේ. එසේ වුවද අනපේක්ෂිත ලෙස ලොව පුරා පැතිර ගිය රෝග කාරකයක් අපේ මාතෘ භූමියට ද පිවිසීම නිසා මුතුන් මිත්තන්ගේ සමයෙහි පවා නොඇසූ තරමේ ආපදාවකට අපි දැන් මුහුණ පා සිටිමු.

එහෙයින් සාමූහික උත්සව මෙවර පැවැත්විය නොහැකි වන්නේ සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීමේ අවශ්‍යතාව සෞඛ්‍ය විශේෂඥයන් විසින් දැඩිව අවධාරණය කර ඇති බැවිනි. රටට සහ ජාතියට එල්ල වන කිසිදු අභියෝගයකට මුහුණ දීමට ජවසම්පන්නව එකරාශී වන ජනතාවක් ලෙස මේ උත්සව සමයේදී ද සමාජ දුරස්ථභාවය පවත්වා ගනිමින් රෝග කාරකය පැතිර යාම වැළැක්වීමට කැපවන මෙන් ඔබගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමි.

සොබාදහමේ සුන්දරත්වයෙන් පොහොසත් වන අලුත් අවුරුදු සමය, මිනිසා පරිසරය සහ ස්වභාවධර්මය වන්දනා කිරීමේ උළෙලකි. දැන් අප එළැඹ සිටින්නේ සොබාදහම සමඟ බද්ධ වීමේ අවශ්‍යතාව වඩාත් දැනෙන මොහොතකය.

චිරාත් කාලයක් තිස්සේ අප ඉමහත් ගෞරවයෙන් සහ උනන්දුවෙන් ඉටු කළ අලුත් අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර, විශේෂයෙන් සුබ මොහොතට නිවැසියන් සියලු දෙනා එක්ව ලිප ගිනි මෙලවීම, කිරි ඉතිරවීම, නැකතට ආහාර අනුභවය සහ සාම්ප්‍රදායික ගනුදෙනු ආදිය පවුලේ අය පමණක් එක්ව සිදු කිරීමට මෙවර කටයුතු කිරීම සුදුසුය.

අලුත් අවුරුදු සතුටෙහි සැබෑ හිමිකරුවන් අපේ කුඩා දූ පුතුන්ය. මෙවර අලුත් අවුරුදු සැණකෙළිවලට සීමා පැනවී ඇති නමුදු දරුවන්ට අවුරුදු සතුට භුක්ති විඳීමට අප අවස්ථාව සැලසිය යුතුය. එබැවින්, ඔබ නිවසේ රැඳී සිටිමින් අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර ඉටු කොට දරුවනට අවුරුදු අසිරිය විඳ ගැනීමට ඉඩ දෙන මෙන් මම සෙනෙහසින් ඔබට සිහිපත් කරමි. ජනතාවත්, රටත් මුහුණපා ඇති වසංගත උවදුර ජයගැනීමට ස්ථිර අධිෂ්ඨානයෙන් අත්වැල් බැඳගැනීම අපේ අලුත් අවුරුදු ප්‍රාර්ථනා අතරට එක් කර ගනිමු.

ඔබ සැමට සුබ අලුත් අවුරුද්දක් වේවා !

**ගෝඨාභය රාජපක්ෂ**

2020 අප්‍රේල් මස 12 වන දින